# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1717/39 – 2011 අගෝස්තු 04 වැනි බ්‍රහස්පතින්දා – 2011.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: සීඅයි/1794.

### කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරිය

එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906 හි පිහිටා ඇති කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906 හි පිහිටි ස්වාධීන තටාක සේවක සංගමය අතර 2011 අප්‍රේල් මස 28 වැනි දින ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

### 2011 අංක 17 දරන සාමූහික ගිවිසුම

### කළම්බු ඩොක්යාඩ් පීඑල්සී

### සහ

### ස්වාධීන තටාක සේවක සංගමය

මෙම සාමූහික ගිවිසුම 2011 වර්ෂයේ අප්‍රේල් මස 28 වන දින කාර්මික ආරවුල් පනත අනුව ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි ලියාපදිංචි කළ සමාගමක් වන එහි ලියාපදිංචි කාර්යාලය කළම්බු ඩොක්යාඩ් පීඑල්සී, කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906 හි ඇති (මින් මතු සේව්‍යයා යනුවෙන් සඳහන් කරනු ලබන) කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි ලියාපදිංචි කළ වෘත්තිය සමිතියක් වන සහ එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 15, කොළඹ වරාය, තටාක පෙදෙස, තැ. පෙ. 906 හි ඇති (මින් මතු සංගමය යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වාධීන තටාක සේවක සංගමය සමඟ ඇතිකරගත් සාමූහික ගිවිසුමය.

01. ***ශීර්ෂ නාමය.***– මෙම ගිවිසුම කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සේවක සාමුහික ගිවිසුම 2011 - 2013 යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ***ආවරණය වන සහ බැඳෙන පාර්ශවයන්.***– මෙම ගිවිසුමෙන් සේව්‍යයා, සංගමය සහ එකඟතාවයකට පැමිණීමට නියමිත වැටුප් පරිමාණයන්ට අදාළ සේවා කාණ්ඩවල, ස්ථිර සේවා ගිවිසුම් මත සේව්‍යයා විසින් සේවයේ අනුයුක්ත කර ඇති, මෙහි මින්මතු අවශ්‍ය වන පරිදි සේවකයා හෝ සේවකයින් යනුවෙන් සඳහන් කරනු ලබන සංගමයේ සාමාජිකයින් ආවරණය වන සහ බැඳෙනු ලැබේ.

03. ***ගිවිසුම බලපවත්වන කාල පරිච්ඡේදය.***– මෙම ගිවිසුම 2011 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවී 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා අඛණ්ඩව බලාත්මක වනු ලැබේ.

04. ***ප්‍රතිපත්ති ප්‍රකාශනය.***– මෙම ගිවිසුම ඇති කරගැනීමට ප්‍රථම බලපැවැත්වූ සාමුහික ගිවිසුම්වල පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඇති කරගන්නා ලද එකඟතාවයන් එලෙසම ක්‍රියාත්මක වනු ඇත. මෙම ගිවිසුමට අදාළ වන සේවා කොන්දේසි සහ නියමයන් වෙනස් නොකිරීමට හෝ විකෘති නොකිරීමට සේව්‍යයා ද, සේවකයින් ද, සංගමය ද ඒකාබද්ධව ගිවිස ගනී. මෙම ගිවිසුම බලාත්මකව පවතින කාලසීමාව තුළ ගිවිසුමේ ප්‍රතිපාදනයන් අභිබවා යන පරිදි වෙනත් පාර්ශ්වයන් සමඟ එකඟතාවයකට එළඹීමට සේව්‍යයා හෝ සංගමය කටයුතු නොකරනු ඇත. කෙසේ වෙතත් අනපේක්ෂිත තත්ත්වයක් හේතුකොට ගෙන ආයතනය තුළ ඇතිවන්නාවූ අර්බුදකාරී අවස්ථාවකදී මෙම ගිවිසුමේ සඳහන් කරුණු නැවත සළකා බැලීමට හෝ අවශ්‍යතාවය මත දෙපාර්ශවයේම එකඟතාවය අනුව මෙම ගිවිසුමට සංශෝධන ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත. ආයතනය හෝ සේවකයන් සම්බන්ධයෙන් එහි/ඔවුන්ගේ ඵලදායීතාවය, මනා කාර්ය සාධනය, කාර්යක්ෂමතාවය සහ සංවර්ධනය උදෙසා තුඩු දෙනවා යැයි පාලනාධිකාරිය විසින් විශ්වාසය තබන ඕනෑම ආකාරයේ යෝජනා හෝ කරුණු පිළිබඳව පාලනාධිකාරිය ඉල්ලා සිටින විටදී පූර්ව කොන්දේසියකින් තොරව සාකච්ඡා සඳහා එළැඹීමට දෙපාර්ශ්වය එකඟ වේ.

එමෙන්ම ඉහත සඳහන් කරුණුවලට අදාළව සංගමය විසින් පාලනාධිකාරියෙන් ඉල්ලා සිටින විටදී පූර්ව කොන්දේසියකින් තොරව සාකච්ඡා සඳහා එළැඹීමට ද දෙපාර්ශවය එකඟ වේ.

| *ගිවිසුම් වර්ෂය* | *වගන්ති අංකය* | *කරුණු* |
|---|---|---|
| | 04 | ප්‍රතිපත්ති ප්‍රකාශනය |
| | 12 | ප්‍රසාද මුදල් |
| 1999 - 2001 | 20 | සේවකයෙකුගේ මරණය |
| | 24 | දැනට භුක්ති විඳිනු ලබන හිමිකම් / ප්‍රතිලාභ සහ සහන |
| | 25 | සේවක සුහද හමුව |
| | 9 | සේවක පුරප්පාඩු (ඇ/ඇ වගන්තිය තවදුරටත් බලනොපානු ඇත.) |
| | 14 | වෛද්‍ය පරීක්ෂණවලට යොමුකිරීම |
| | 20 | සේවක වෘත්තීය අධ්‍යාපනය |
| | 23 | මැතිවරණ, ඇඳිරි නීතිය පැනවීම යනාදී නිවාඩු |
| | 25 | විදේශ ගතවීම සඳහා පඩිරහිත නිවාඩු |
| 2002 - 2004 | 27 | ස්ථාන මාරුවීම් |
| | 28 | දිවා / රාත්‍රී ආහාර විවේකය |
| | 29 | කාර්මික ආරක්ෂාව |
| | 30 | ආයතනයේ විනය පවත්වාගෙන යෑම |
| | 32 | කාර්මික ආරවුල් බේරුම් කිරීම |
| | 06 | වැටුප් පරිමානයන් හා වැටුප් වර්ධක (ආ වගන්තිය නොවෙනස්ව පවතිනු ඇත) |
| 2005 - 2007 | 14 | වෘත්තීය සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීම |
| | 16 | Stand by අවස්ථාවක දී වෙනත් අංශයක රාජකාරිය සඳහා යෙදවීම |
| | 05(ii) | වාර්ෂික කාර්යය සාධනය ඇගයීමේ ක්‍රියාපටිපාටිය |
| | 05(iv) | අතිකාල ගණනය |
| | 05(v) | අතිකාල ගණනය කිරීම විධිමත් කිරීම |
| | 06 | උපයන විට ගෙවීමේ බද්ධ අඩුකිරීම |
| | 07 | විශ්‍රාමික දීමනා |
| | 08 | රන් තිළින ප්‍රදානය |
| | 09 | උසස්වීම් |
| 2008 - 2010 | 10(ii) | ස්ථානුරූපී පදනම මත ආධුනිකයින් බඳවාගැනීම |
| | 12 | උදෑසන ආහාරවේල නොමිලේ ලබාදීම |
| | 13(i)(ඉ) | වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන දූදරුවන්ගේ වයස් සීමාවන් |
| | 13(i)(ඒ) | බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම |
| | 13(ii)(අ) | වෛද්‍ය යැපීම් දීමනාව |
| | 13(iii)(i) | දූ දරු ශිෂ්‍යත්ව |
| | 13(v) | නුවරඑළිය නිවාඩු නිකේතනය වෙන්කර ගැනීම |
| | 14 | වැඩ පැවරීමේ පත් |

05. වැටුප් හා දීමනා :

(අ) වැටුප් හා දීමනාවන් වැඩිකිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කරනු ඇත.

| *වර්ෂය* | *මූලික වැටුප වෙනුවෙන්* | *දීමනාවන් වෙනුවෙන්* |
|---|---|---|
| 2011 | රුපියල් මිලියන 100 | රුපියල් මිලියන 2.25 |
| 2012 | රුපියල් මිලියන 100 | රුපියල් මිලියන 15 |
| 2013 | රුපියල් මිලියන 100 | රුපියල් මිලියන 30 |

(ආ) 2011, 2012 හා 2013 වර්ෂයන්ට අදාළව වැටුප්, දීමනා හා අදාළ අනෙකුත් කරුණු නිශ්චය කරගැනීම සඳහා පිටු අංක 04 සහ 05 වගු අදාළ කරගනු ඇත. නව වැටුප් පරිමානයන් පිටු අංක 14 සඳහන් පරිදි වේ.

(ඇ) 2012 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙර වර්ෂයේ පඩි රහිත නිවාඩු ලබාගත් සේවක මහතුන්හට පොදු වැටුප් වැඩිකිරීම් ලබානොදෙනු ඇත. එසේ වුවද. හදිසි අනතුරක් හේතුවෙන් රෝහල් ගතවීම, සැත්කම්, බරපතල රෝගාබාධ හා හදිසි ආපදාවක් හෝ පවුලේ සාමාජිකයකුගේ මරණයක් හේතුවෙන් පඩි රහිත නිවාඩු යාමට සිදුවන සේවක මහතුන්ගේ අභියාචනා සඳහා සහන සලසනු ඇත.

06. **වාර්ෂික කාර්යය සාධනය ඇගයීමේ ක්‍රියාපටිපාටිය**

* නියමිත වේලාවට සේවයට වාර්තා කිරීම (ලකුණු 10)

නියමිත වේලාවට සේවයට වාර්තා කිරීම වෙනුවෙන් ලබාදුන් ලකුණු 10යෙන් ලකුණු 05ක් ප්‍රමාදවීමකින් තොරව නියමිත වේලාවට සේවා ස්ථානයට වාර්තා කිරීම සඳහා ද ඉතිරි ලකුණු 05 නියමිත වේලාවට සේවයට වාර්තා කිරීම වශයෙන් සංශෝධනය කිරීමටද එකඟවේ.

* විනය වාර්තා (ලකුණු 10)

නොකැලැල් සේවා වාර්තාව වෙනුවෙන් ලබාදෙන ලකුණු 10යෙන් ලකුණු අඩුකිරීම පිළිබඳව දැනට පිළිගෙන ඇති ක්‍රියාපටිපාටිය අමතරව පරිඝනක පද්ධතියට ඇතුළත් කරනු ලබන වාචික අවවාද කිරීම් (Critical Incident) එකක් වෙනුවෙන් එක ලකුණක් බැගින් අඩු කරනු ලබන අතර, එය සේවක මහතා වෙත දැනුම්දීමෙන් අනතුරුව ඇතුළත් කලයුතුවේ.

* නිෂ්පාදන අංශයට නිර්මාණශීලි ක්‍රියාවක් ඉටු කිරීම

නිෂ්පාදන අංශයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවයට වටිනාකමක් එකතු කරන නිර්මාණශීලී ක්‍රියාවන් ඉටුකිරීම වෙනුවෙන් සේවක මහතුන්හට එම නිර්මාණශීලී ක්‍රියාව පුහුණු කිරීමේ උපදේශ කමිටුව (Training Advisory committee) මගින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව සෑහීමට පත්වන්නේනම් පමණක් ශ්‍රේණි අතර උසස්වීමක් ලබාදීමට කටයුතු කරනු ඇත.

07. **සේවක පුරප්පාඩු**

* සේවක පුරප්පාඩු පිලිබඳව සෑම වසරකම ඔක්තෝබර් මාසයේදී සාකච්ඡා කරනු ලබන අතර බඳවා ගැනීම් ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

* වැඩමුලික හා පරිපාලක වෘත්තීන් සඳහා බඳවාගනු ලබන සේවක මහතුන් අතුරින් 25% ක් සමාගමෙන් පිටත අයඳුම් කරුවන්ගෙන් බඳවා ගැනීම පිලිබඳව පාර්ශවයන් එකඟවන අතර එය පුහුණු කිරීමේ උපදේශක කමිටුවේ නිර්දේශය මත සිදු කරනු ඇත.

## සාමූහික ගිවිසුම 2011/2013

### වැටුප සහ ඊට ඇතුළත් වන සෙසු දීමනා

| අංක | විෂයය | පවතින ආකාරය | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| 1 | මූලික වැටුප | | රු. 2,500/-ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු. 125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br><br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 480/-ක් ද වැඩමූලික ශ්‍රේණි සඳහා රු. 600/-ක් ද මූලික වැටුපට එකතු කෙරේ. | රු. 2,500/-ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු. 125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br><br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 518/-ක් ද වැඩමූලික ශ්‍රේණි සඳහා රු. 648/-ක් ද මූලික වැටුපට එකතු කෙරේ. | රු. 2,500/-ක සම්මත මුදලකින් සහ සේවා කාලය පදනම් කොට ගෙන වර්ෂයකට රු. 125/- බැගින් ලබාදීමට කටයුතු කෙරේ.<br><br>පරිපාලක ශ්‍රේණි සඳහා රු. 596/-ක් ද වැඩමූලික ශ්‍රේණි සඳහා රු. 745/-ක් ද මූලික වැටුපට එකතු කෙරේ. |
| 2 | නිෂ්පාදනයට සෘජු ලෙස දායක වන සේවක මහතුන් සඳහා ලබාදෙන දීමනාව | පැය 100ට වැඩි රු. 950/-<br>පැය 50 < 100 රු. 475/- | | පැය 100ට වැඩි රු. 1026/-<br>පැය 50 < 100 රු. 513/- | පැය 100ට වැඩි රු. 1180/-<br>පැය 50 < 100 රු. 590/- |
| 3 | පරිපාලක / වැඩමූලික දීමනාව | පරිපාලක: රු. 4,000/-<br>වැඩමූලික: රු. 5,000/- | | රු. 4,320/- දක්වා වැඩි කෙරේ<br>රු. 5,400/- දක්වා වැඩි කෙරේ | රු. 4,968/- දක්වා වැඩි කෙරේ<br>රු. 6,210/- දක්වා වැඩි කෙරේ |
| | පැමිණීමේ දිරි දීමනාව | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු. 340/-<br><br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා දිනකට රු. 360/- | | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු. 364/-<br><br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා දිනකට රු. 385/- | කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා දිනකට රු. 415/-<br><br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා දිනකට රු. 439/- |
| | | | වැඩි කරන ලද මුදල ගෙවනුයේ පැමිණීමේ දීමනාව සම්බන්ධව 2002/2004 සාමූහික ගිවිසුමේ 06 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද නොවී සේවයට වාර්තා කිරීම වෙනුවෙනි. රටේ ඇති වන හදිසි තත්වයක් හේතුවෙන් ප්‍රමාදවී පැමිණීම / නියමිත කාලයට පුර්ම සේවයෙන් මිදීයාම යන අවස්ථාවන්හිදී පැමිණීමේ දීමනාව නියමිත ආකාරයට ගෙවනු ඇත. | | |
| 4 | සේවක ඇගයීම – කාර්මික ශ්‍රේණි / ලිපිකාරවැඩමූලික හා පරිපාලක වසර 08ක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් වූ මාසික දීමනාව | ලිපිකාර හා වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 1,000/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 2,000/- | ලිපිකාර හා වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 1,250/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 2,250/- | ලිපිකාර හා වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 1,350/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 2,430/- | ලිපිකාර හා වැඩමූලික හා පරිපාලක ශ්‍රේණි සඳහා රු. 1,550/-<br>කාර්මික ශ්‍රේණි සඳහා රු. 2,795/- |
| | සේවක ඇගයීම – ලිපිකාර ශ්‍රේණියේ Supra/ Snr. Staff Asst./ Staff Asst. සඳහා දීමනාව | Supra Rs. 1750/-<br>Snr. Staff Asst. Rs. 1250/-<br>Staff Asst. Rs. 1000/- | Supra Rs. 2350/-<br>Snr. Staff Asst. Rs. 1250/-<br>Staff Asst. Rs. 1000/- | Supra Rs. 2538/-<br>Snr. Staff Asst. Rs. 1350/-<br>Staff Asst. Rs. 1080/- | Supra Rs. 2920/-<br>Snr. Staff Asst. Rs. 1553/-<br>Staff Asst. Rs. 1242/- |
| 5 | කණ්ඩායම් නායක තනතුර සඳහා | මසකට රු. 1000/- දීමනාවක් | රු. 1250/- | රු. 1350/- | රු. 1550/- |

## සාමූහික ගිවිසුම 2011/2013

වැටුපට ඇතුළත් නොවන සෙසු දීමනා

<table>
<tr><th>අඅ</th><th colspan="2">විෂයය</th><th>පවතින ආකාරය</th><th>2011</th><th>2012</th><th>2013</th></tr>
<tr><td rowspan="3">1</td><td rowspan="3">විදේශගතවීම් වෙනුවෙන් වන යැපීම් දීමනාවන් (ආහාර, නවාතැන් පහසුකම් හා ප්‍රවාහන පහසුකම් සහිතව)</td><td>ව්‍යාපෘති සඳහා</td><td>කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 150කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 200කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 20කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 30කි.</td><td colspan="3">වෙනස් නොවේ</td></tr>
<tr><td>නැව් අළුත්වැඩියා සඳහා</td><td>කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 150කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 200කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 20කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 30කි.</td><td colspan="3">කාර්මික ශ්‍රේණි සඳහා ඇ. ඩොලර් 250කි.<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා ඇ. ඩොලර් 300කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම<br>කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 40කි.<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා ඇ. ඩොලර් 50කි.</td></tr>
<tr><td>වගකීම් සහිත කාලසීමාවන් සඳහා</td><td>කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 150කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 200කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 20කි.<br>පරිපාලක හා වැඩමූලික ඇ. ඩොලර් 30කි.</td><td colspan="3">කාර්මික ශ්‍රේණි සඳහා ඇ. ඩොලර් 250කි.<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා ඇ. ඩොලර් 300කි.<br>(මුල් දින 05 සඳහා)<br><br>වැඩිවන සෑම දිනයක් සඳහාම<br>කාර්මික ශ්‍රේණි ඇ. ඩොලර් 40කි.<br>පරිපාලක හා වැඩමූලික ශ්‍රේණි සඳහා ඇ. ඩොලර් 50කි.</td></tr>
<tr><td>2</td><td colspan="2">දොඹකර ක්‍රියාකරුවන්ගේ දුෂ්කර දීමනාව</td><td>රු. 25/=<br>රු. 35/=</td><td>වෙනස් නොවේ</td><td>රු. 27/=<br>රු. 38/=</td><td>රු. 31/=<br>රු. 43/=</td></tr>
<tr><td>3</td><td colspan="2">විකිරණ ශිල්පීන් සඳහා</td><td>මසකට රු. 1000/= දීමනාවක්</td><td>රු. 1250/=</td><td>රු. 1350/=</td><td>රු. 1550/=</td></tr>
<tr><td rowspan="2">4</td><td colspan="2">ඉන්ධන දීමනාව</td><td>කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා<br>කි.මී. 1ට රු. 2.50<br>(උපරිම කි.මී. 32 කි)<br><br>විශේෂ ශ්‍රේණියේ වසර 05 ක් සඳහා<br>කි.මී. 1ට රු. 5.00<br>(උපරිම කි.මී. 40 කි)<br><br>වැඩමූලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා<br>කි.මී. 1ට රු. 7.00<br>(උපරිම කි.මී. 40 කි)</td><td>වෙනස් නොවේ</td><td>කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා<br>කි.මී. 1ට රු. 2.70<br>(උපරිම කි.මී. 32 කි)<br><br>විශේෂ ශ්‍රේණියේ වසර 05 ක් සඳහා<br>කි.මී. 1ට රු. 5.40<br>(උපරිම කි.මී. 40 කි)<br><br>වැඩමූලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා<br>කි.මී. 1ට රු. 7.60<br>(උපරිම කි.මී. 40 කි)</td><td>කාර්මික හා ලිපිකරු ශ්‍රේණි සඳහා<br>කි.මී. 1ට රු. 3.10<br>(උපරිම කි.මී. 32 කි)<br><br>විශේෂ ශ්‍රේණියේ වසර 05 ක් සඳහා<br>කි.මී. 1ට රු. 6.20<br>(උපරිම කි.මී. 40 කි)<br><br>වැඩමූලික පරිපාලක හා සුප්‍රා ශ්‍රේණි සඳහා<br>කි.මී. 1ට රු. 8.75<br>(උපරිම කි.මී. 40 කි)</td></tr>
<tr><td colspan="2">වාහන නඩත්තු දීමනා<br><br>(නඩත්තු දීමනාව ලබාගැනීම සඳහා අවම වශයෙන් දින 15 ක් රථ වාහනය මඟින් සේවයට වාර්තා කළ යුතුය.)</td><td>වැඩමූලික රු. 2500/=<br>පරිපාලක රු. 2000/=</td><td>වෙනස් නොවේ</td><td>වැඩමූලික රු. 2700/=<br>පරිපාලක රු. 2160/=</td><td>වැඩමූලික රු. 3105/=<br>පරිපාලක රු. 2484/=</td></tr>
</table>

08. **CDL** *සංචිතයට අදාල වැටුප් හා දීමනා*

| විෂයය | | | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| | මූලික වැටුප් වැඩිවීම | | රු. 2,250 | රු. 2,250 | රු. 2,250 |
| පැමිණීමේ දීමනාව | පැස්සුම්කරුවන් හා වානේ තහඩු පිරිසැකසුම්කරුවන් | කාර්මික ශ්‍රේණි | රු. 175 | රු. 189 | රු. 217 |
| | | පරිපාලක ශ්‍රේණි | රු. 200 | රු. 216 | රු. 248 |
| | අනිකුත් කාර්මික වෘත්තීන් | කාර්මික ශ්‍රේණි | රු. 150 | රු. 162 | රු. 186 |
| | | පරිපාලක ශ්‍රේණි | රු. 175 | රු. 189 | රු.217 |
| | ලිපිකරුවන් හා අනිකුත් වෘත්තීන් | | රු. 135 | රු. 146 | රු.168 |
| | පැමිණීමේ දීමනාව සඳහා නියමිත මාසයේදී සේවයට වාර්තා කළ යුතු අවම දින ගණන සපුරා තිබිය යුතුය. | | | | |
| වාර්ෂික වේතනාධිකයන් | ඇගයීමක් සිදුකිරීමෙන් අනතුරුව පඩි රහිත නිවාඩු ලබා නොගත් සේවක මහතුන් හට පමණක් උපරිම වශයෙන් වේතනාධික 02 ක් ලබාදීමට කටයුතු කෙරේ. එක් වේතනාධිකයක අගය රු. 200 කි. | | | | |
| අවම වැටුප | පැස්සුකම්කරුවන් හා වානේ තහඩු පිරිසැකසුම්කරුවන් | | රු. 12,000 | රු. 13,000 | රු. 14,000 |
| | අනිකුත් කාර්මික වෘත්තීන් | | රු. 11,000 | රු. 12,000 | රු. 13,000 |
| | ලිපිකරුවන් හා නිෂ්පාදන නොවන ශ්‍රේණි | | රු. 10,000 | රු. 11,000 | රු. 12,000 |
| රු. 25,000 ණය මුදල | | | රු. 50,000 දක්වා වැඩිකෙරේ | | |

*****මූලික වැටුප් වැඩිවීම සඳහා අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කළයුතුවේ.

09. *නිවාස හා යතුරුපැදි ණය මුදල*

(අ) ආයතනය මගින් ලබාදෙනු ලබන නිවාස හා වාහන ණය මුදල පහත සඳහන් පරිදි සංශෝධනය කරන අතර, එක් සේවක මහතෙකුහට තවත් සේවක මහතුන් තිදෙනෙක් සඳහා ඇපකරුවන් වශයෙන් අත්සන් තැබීමට අවස්ථාව ලබාදෙනු ඇත.

| *සේවා කාලය* | *දැනට පවතින නිවාස ණය මුදල* | *සංශෝධිත ණය මුදල* |
|---|---|---|
| වසර 03 සිට 05 දක්වා | 150,000 | 250,000 |
| වසර 06 සිට 08 දක්වා | 200,000 | 300,000 |
| වසර 09 සිට 12 දක්වා | 250,000 | 350,000 |
| වසර 12 ට වැඩි | 350,000 | 450,000 |

| *ශ්‍රේණි* | *දැනට පවතින වාහන ණය මුදල* | *සංශෝධිත ණය මුදල* |
|---|---|---|
| කාර්මික හා ලිපිකාර | 150,000 | 200,000 |
| වැඩමූලික හා පරිපාලක | 300,000 | 350,000 |

(ආ) ආයතනයේ අනුග්‍රහය යටතේ ලංකා බැංකුව මගින් ලබාදෙන නිවාස ණය මුදල (උපරිමය රුපියල් මිලියන 01) සඳහා දැනට පවතින කොන්දේසි ලිහිල් කරනු ලබන අතර ඒ අනුව නව කොන්දේසි පහත සඳහන් පරිදි වේ.

- නව නිවසක් ඉදිකිරීම, ඉඩමක් මිලදී ගැනීමට, පවතින නිවසට කොටසක් එකතු කරගැනීම සඳහා මෙම ණය මුදල ලබාදීමට කටයුතු කෙරේ.
- අවම සේවා කාලය වසර 10ක් සම්පූර්ණ කළයුතු වන අතර, ණය මුදල ලබාගන්නා ලද දින සිට ඉදිරියට අවම වශයෙන් වසර 05ක සේවා කාලයක් තිබිය යුතුවේ.

- ඉදිරියට පවතින සේවා කාලය පදනම් කොට ගෙන ලබාදෙන ණය මුදල හා ආපසු අයකර ගැනීමේ කාලසීමාව වෙනස්වන අතර, උපරිමය රුපියල් මිලියන 01කි. (උදා- ඉදිරි සේවා කාලය වසර 05ක් නම් ණය මුදල ලක්ෂ 05කි.)

- ණය වාරික මුදලද අයකර ගැනීමෙන් අනතුරුව මුළු අඩුකිරීම් සියල්ල ශුද්ධ වැටුපෙන් 40% ක් ඉක්ම නොයායුතුය.

- මුළු සේවා කාලයටම මෙම නිවාස ණය මුදල පමණක් හිමිවේ.

- ඉඩමක් හෝ ඉඩමක් සමග නිවසක් මිලදී ගැනීමේදී තමන්ට අයිති නිවසක් නොතිබිය යුතුය.

- සමාගමේ නිවාස ණය මුදල ලබාගෙන වාරික 36ක් ගෙවා අවසාන කර ඇත්නම් ඉතිරි වාරික ප්‍රමාණය එකවර ගෙවා නිම කිරීමෙන් අනතුරුව මෙම ණය මුදල අයදුම්කිරීමට අවස්ථාව ලබාදේ.

- ණය මුදල කොටස් වශයෙන් මුදාහරිනු ලබන අතර, එක් කොටසක් මුදා හැරීම සඳහා ප්‍රමාණවත් වැඩ කොටසක් නිම කර ඇති බවට පරීක්ෂාවකින් පසුව සෑහීමට පත්විය යුතුය.

- ණය මුදල නිකුත් කරනු ලබන බැංකුව වෙත තම මාසික වැටුප අනිවාර්යයෙන්ම බැර කළ යුතුවේ.

- මීට අමතරව බැංකුව විසින් නියම කරනු ලබන කොන්දේසි හා නියමයන් ද මෙම ණය මුදල ලබා ගැනීමේදී බලපාන අතර මේ සඳහා නව කොන්දේසි එකතු කිරීම හෝ ලිහිල් කිරීමේ අභිමතව තවදුරටත් කළමණාකාරිත්වය සතුවේ.

10. ***නව වැටුප් පරිමාණයක් හඳුන්වාදීම.***- පහත සඳහන් වෘත්තීන්ට අදාළව නව වැටුප් පරිමාණයක් හඳුන්වාදෙනු ලබන අතර 2011 ජනවාරි මස 01 වන දින සිට ස්ථිර සේවයට අනුයුක්ත කරනු ලබන සේවක මහතුන් සඳහා මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනු ඇත. ඉදිරියේදී නව වෘත්තීන් ඇතුලත් කිරීම හා පොදු වැඩිකිරීම්, සිදුකිරීම් ද දෙපාර්ශවයේ එකඟත්වය මත සිදුකරනු ඇත.

අරක්කැමි, සහය අරක්කැමි, මුළුතැන්ගෙයි සහයක, රියැදුරු, රියැදුරු සහයක, ආරක්ෂක නියාමක, වේසර්වරු, වෛද්‍ය මධ්‍යස්ථාන සහයකයන්, ගබඩා කම්කරුවන් යන වෘත්තීන්

| ශ්‍රේණිය | සේවක වැටුප් පරිමාණය | පරිපාලක වැටුප් පරිමාණය |
|---|---|---|
| SP | 14000/- x 280/- x 75 35,000/- | |
| HG | 13000/- x 260/- x 75 32,500/- | |
| I | 12000/- x 240/- x 75 30,000/- | 17000/- x 340/- x 75 42500/- |
| II | 11000/- x 220/- x 75 27,500/- | 16000/- x 320/- x 75 40000/- |
| III | 10000/- x 200/- x 75 25,000/- | 15000/- x 300/- x 75/- 37,500/- |
| IV | 9000/- x 180/- x 75 22,500/- | |

11. ***සේවය ස්ථිර කිරීම.***-

(අ) සේවය ස්ථිර කිරීමට අදාළ අනෙකුත් අවශ්‍යතාවයන් සපුරා ඇති CDL සංචිතයේ සේවයේ නියුතු සේවක මහතුන් වසර 04 ක සේවා කාලය සම්පූර්ණ කළ පසු ස්ථිර කරනු ඇත.

(ආ) CDL සංචිතයේ සේවයේ නියුතු ජාතික ආධුනිකත්ව මණ්ඩලය යටතේ කාර්මික අංශයෙන් ඩොක්යාඩ් සමාගම තුළ පුහුණුව ලැබූවන් වසර 03 කින් ස්ථිර පදනමකට ඇතුළත් කර ගනු ලබන අතර එය නිසි ඇගයීමකින් පසු පාලනාධිකාරියේ අභිමතය මත පමණක් සිදු කෙරේ.

(ඇ) CDL සංචිතයට ඇතුළත් වීමට පෙර සේවය කර ඇත්නම් ස්ථිර පදනමට ඇතුළත් කර ගැනීමේදී සංචිතයේ සිටිය යුතු කාලය පහත සඳහන් පරිදි අඩුකෙරේ. කෙසේ වෙතත් ආධුනිකත්ව අධිකාරියේ පුහුණුව ලබා තිබීම හේතුවෙන් වසරක කාලයක් අඩුකිරීම හා කලින් සේවය කර තිබීම හේතුවෙන් කාලය අඩුකිරීම යන සහන දෙකෙන් එක් සහනයක් පමණක් ලබාදෙනු ඇත.

| **පෙර සේවා කාලය** | **අඩුකරනු ලබන කාලසීමාව** |
|---|---|
| වසර 02 සිට 03 දක්වා | වසර 01 |
| වසර 03 සිට 04 දක්වා | වසර 1.5 |
| වසර 04 ට වැඩි | වසර 02 |

12. *වැටුප් රහිත නිවාඩු හේතුවෙන් සේවයෙන් පහ කිරීම*

පසුගිය වසර 05 අතුරින් ඕනෑම වසර 02ක දී එක් වසරක වැටුප් රහිත නිවාඩු 10 බැගින් හෝ ඊට වැඩියෙන් ලබා ඇතිවිට සේවයෙන් පහකරනු ඇත.

13. **සේවක සුබසාධනය.-**

(i) වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමය

(අ) නේවාසික හා බාහිර ප්‍රතිකාර දීමනාව

| වර්ෂය | නේවාසික ප්‍රතිකාර දීමනාව | බාහිර ප්‍රතිකාර දීමනාව |
|---|---|---|
| 2011 | වෙනසක් සිදුනොවේ | වෙනසක් සිදුනොවේ |
| 2012 | රු. 121,000/= | රු. 27,500/= |
| 2013 | රු. 132,000/= | රු. 30,000/= |

(ආ) **විශේෂිත ශල්‍යකර්ම**

විශේෂිත ශල්‍යකර්ම යටතේ ජනාධිපති අරමුදලින් හා සේවක භාරකාර අරමුදලින් ප්‍රතිපාදන ලබාගත් පසු ඉතිරි හිඟ මුදලක් ඇතොත් රු. ලක්ෂ තුනක (300,000/-) උපරිමයකට යටත්ව වසරකට සේවකයින් 10 දෙනෙකු සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීමට එකඟවේ.

(ඇ) **රජයේ රෝහලක ප්‍රතිකාර ලබාගැනීමේදී සිදු කරනු ලබන ගෙවීම්**

රජයේ රෝහලක නේවාසික ප්‍රතිකාර ලබාගැනීමේදී එක් දිනක් සඳහා රු. 1,500/- ක දීමනාවක් ලබාදීමට එකඟවන අතර, මෙය උපරිම මාස දෙකක කාලයක් සඳහා පමණක් ලබාදීම පිළිබඳව දෙපාර්ශවයම එකඟවේ.

(ඈ) **වෛද්‍ය උපකරණ**

වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත දැනට ප්‍රතිපූර්ණය කරනු ලබන වෛද්‍ය උපකරණවලට අමතරව ශ්‍රවණාබාධිත උපකරණ සඳහා යන වියදම් ද ප්‍රතිපූර්ණය කිරීමට එකඟවේ.

(ඉ) **සතුන් සපා කෑම**

විවිධාකාරවූ සතුන් සපා කෑමෙන් හෝ සර්පයන් දෂ්ඨ කිරීම හේතුවෙන් විෂ ශරීරගතවූ විට අදාළ වෛද්‍යවරයා එන්නත් නිර්දේශ කරන්නේ නම් ඒ වෙනුවෙන් වැයවන මුදල රු. 30,000/- ක උපරිමයකට යටත්ව ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳව දෙපාර්ශවය එකඟවේ.

(ඊ) **උපැස් යුවලක් මිලදී ගැනීම**

අක්ෂි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත උපැස් යුවලක් මිලදී ගන්නේ නම් එහි රාමුව සඳහා රු. 9,000/- ක හා කාචය සඳහා රු. 3,500/ක උපරිමයකට යටත්ව නේවාසික වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳව පාර්ශවයන් එකඟවේ.

(උ) **පරිපූර්ණ වෛද්‍ය පරීක්ෂණය**

වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත පරිපූර්ණ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ගෙවනු ලබන මුදලින් රු. 5,000/- ක උපරිමයකට යටත්ව නේවාසික වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳව එකඟතාවයකට ද පාර්ශවකරුවන් එළඹ සිටී. තවද එම එකඟතාවයට අනුව සාමාජිකයාට හෝ තම භාර්යාවට/ස්වාමිපුරුෂයාට යන දෙදෙනාගෙන් එක් අයෙකුට මෙම ප්‍රතිලාභය හිමිවේ.

(ඌ) **CDL කොන්ත්‍රාත් පදනමේ සේවක මහතුන් සඳහා නේවාසික වෛද්‍ය ප්‍රතිකාර**

අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද CDL කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ නියුතු සේවක මහතුන් සඳහා රක්ෂණ සමාගම විසින් ඉදිරිපත් කරනු ලබන සාමාන්‍ය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ සීමාවන්ට යටත්ව රු. 60,000/- උපරිමයකට අදාළ සේවක මහතාහට පමණක් නේවාසිකව ප්‍රතිකාර ලබාගැනීමේ පහසුකම් ලබාදීම පිළිබඳව පාර්ශවයන් එකඟවේ.

(එ) **සාමාන්‍ය දරු උපතකදී ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල**

සාමාන්‍ය දරු උපතකදී ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල රු. 40,000/- දක්වා වැඩිකිරීම් පිළිබඳව දෙපාර්ශවය එකඟවේ.

(ඒ) **ආයතනය තුළ රාජකාරීන් සිදුකරන අතරතුර හදිසි අනතුරකට භාජනයවීම**

රාජකාරීන්වල නියැලී සිටින අවස්ථාවකදී හදිසි අනතුරකට භාජනයවීමෙන් හෝ රෝගී තත්ත්වයක් හේතුවෙන් රෝහල්ගත කිරීමට සිදුවීමේ දී හා රෝහලෙන් මිදීයාමේදී ප්‍රවාහන පහසුකම් ලබාදීම සමාගමේ වෛද්‍යවරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ වෛද්‍ය මධ්‍යස්ථානය මගින් සිදුකිරීමට එකඟවේ.

(ඔ) **විදේශ සේවකයින් වෛද්‍ය පරීක්ෂණයකට යොමු කිරීම**

ආයතනයේ රාජකාරීන් සඳහා විදේශීය සේවකයින් යොදවා ගැනීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකට යොමු කිරීමට එකඟවේ.

(ii) **සේවක රක්ෂණය**

පැය 24 පුරා ආවරණය වන පුද්ගල හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ දැනට රක්ෂණය කර ඇති මුදල රු. 50,000/- කින් වැඩිකිරීමට ද දෙපාර්ශවයන් එකඟවේ. ඒ අනුව නව සංශෝධනය පහත සඳහන් පරිදි වේ.

| | *දැනට පවතින මුදල රු.* | *සංශෝධිත මුදල රු.* |
|---|---|---|
| කාර්මික හා ලිපිකරු ශ්‍රේණිය | 325,000/- | 375,000/- |
| පරිපාලක ශ්‍රේණි | 350,000/- | 400,000/- |
| වැඩමූලික ශ්‍රේණි | 375,000/- | 425,000/- |

(iii) **සේවක දූදරු ශිෂ්‍යත්වය**

5 වසර ශිෂ්‍යත්වය සමත් දූ දරුවන්ට රු. 1,500/- මුදලක් පිරිනැමෙනු ඇත.

(iv) **සේවක මහතෙකුගේ හෝ සේවිකාවකගේ මංගල උත්සව අවස්ථාවන්**

මංගල උත්සවය සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල වාරික 24 කින් අය කිරීමේ පදනම මත මාස 03 ක මූලික වැටුපට සමාන මුදලක් දක්වා වැඩි කරනු ලැබේ.

(v) **අවමංගල්‍ය අවස්ථාවන්**

රාජකාරී කාලය තුළ සේවක මහතෙකු මියගිය විට එම අවස්ථාවේ සිට අවසන් කටයුතු නිමවෙන තෙක් දේහයේ කටයුතු හා සියලු සංග්‍රහ කටයුතු සුබසාධක අංශයේ අධීක්ෂණය යටතේ ආයතනය මගින් සිදුකරන අතර, ඒ සඳහා වාහනයක් සපයාදීමට ද කටයුතු කෙරේ.

අවමංගල කටයුතුවලට සහභාගිවීම සඳහා ලබාදෙන බස් රථය සවස 4.30ට ලබාදීමට කටයුතු කෙරේ.

* අවසන් කටයුතු දිනයේ ලබාදෙන වෑන් රථය සඳහා වූ උපරිම දුර ප්‍රමාණය කි.මී. 60 දක්වා දීර්ඝ කෙරේ. කෙසේ වුවද වෑන් රථය මුදාහරින වේලාව වන ප.ව. 2.30 හි කිසිදු වෙනසක් සිදු නොකෙරේ.

* අවමංගල්‍ය උත්සවයකට සහභාගිවීම සඳහා ලබා දෙන බස් රථයේ ගාස්තු අයකිරීමේදී ස්ථිර සහ ස්ථිර නොවන භේදයකින් තොරව සමාන ගාස්තු අයකෙරේ.

(vi) ***වන්දි මුදල් ගෙවීම.***– රාජකාරී කාලය තුළ සිදුවන හදිසි අනතුරක දී මියයන සේවක මහතෙකු වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල රු. 1,250,000 දක්වා සංශෝධනය කෙරේ.

(vii) ***රියැදුරු මහතෙකු තම රාජකාරී නියැලීමේදී වාහනය අනතුරකට භාජනය වීම.***– රියැදුරු මහතෙකු තම රාජකාරී නියැලීමේදී වාහනය අනතුරකට භාජනය වුවහොත් අධිකරණ කටයුතු හැරුණු කොට සෙසු නීතිමය කටයුතු සඳහා ආයතනය මැදිහත්වීමට කටයුතු කිරීමට එකඟවන නමුත් බීමත්කම වැනි අවස්ථාවන්හිදී එවැනි මැදිහත්වීමකට එකඟ නොවේ.

(viii) ***සුභසාධන පහසුකම් සේවා ගාස්තු සංශෝධනය.***–

* ***විවාහක නිල නිවාස.***– ගිවිසුම් කාලය ඉක්මවී තවදුරටත් විවාහක නිල නිවාසවල පදිංචි වී ඇති සේවක මහතුන් මෙම සාමූහික ගිවිසුමට අත්සන් තබා මාස 03 ක් ගතවීමට පෙර නිල නිවාසවලින් ඉවත්විය යුතු බවට පාර්ශ්වයන් එකඟවේ.

* *ගාස්තු සංශෝධනය.–* දැනට සේවක මහත්ම මහත්මීන් සඳහා සපයනු ලබන සුබසාධන සේවා ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

කෙසේ වුවද නිල නිවාස සංකීර්ණයේ ගාස්තු සංශෝධනය කිරීමක් සිදු නොකරන නමුත් එය ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව වර්තමානයට සරිලන ගාස්තු සංශෝධනයකට පාර්ශවයන් එකඟවේ.


| *කරුණ* | *පවතින ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| චාරිකා සඳහා වායු සමීකරණය කරන ලද බස් රථය | කි.මී. 01ක් සඳහා රු. 30 | කි.මී. 01ක් සඳහා රු. 37 |
| වායු සමීකරණය නොකරන ලද බස් රථය | කි.මී. 01ක් සඳහා රු. 15 | කි.මී. 01ක් සඳහා රු. 22 |

අවමඟුල් කටයුතුවලට සහභාගිවීම සඳහා බස් රථය මුදාහැරීමේදී දැනට අයකරන ගාස්තුව සංශෝධනය නොකෙරේ. මීට අමතරව බස් රථය මුදාහැරීම සම්බන්ධයෙන් පවත්නා කොන්දේසි නොවෙනස්ව එලෙසම පවතිනු ඇත.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කොට මාස 3ක් ඇතුලත තීරණයකට එළඹීමට පාර්ශවයන් එකඟ වේ.

(i) හොඳහිත මත පදනම් වූ දීමනාව සංශෝධනය කිරීම පිළිබඳව
(ii) බණ්ඩනය වූ පූර්ව සේවා කාලය සැලකිල්ලට භාජනය කිරීම පිළිබඳව

මෙයට සාක්ෂි වශයෙන් පාර්ශවයන් 2011 අප්‍රේල් මස 28 වන දින අත්සන් තබන ලදී.


A. Nakauchi
Chairman
Colombo Dockyard PLC
(Company No. PQ 50)
අකිහිකෝ නකලුචි
කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සඳහා සහ වෙනුවට

Mangala P. B. Yapa
Managing Director / CEO
COLOMBO DOCKYARD PLC
මංගල ප්‍රේම බණ්ඩා යාපා
කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සඳහා සහ වෙනුවට

ස්වාධීන තටාක සේවක සංගමය
කොළඹ නැව් තටාකාංගනය
කොළඹ 15
ලි.ප. 5373
අබේසිංහ ආරච්චිගේ ශ්‍යාමල් කුමාර ලක්ප්‍රිය අබේසිංහ
ස්වාධීන තටාක සේවක සංගමය සඳහා සහ වෙනුවට

ස්වාධීන තටාක සේවක සංගමය
කොළඹ නැව් තටාකාංගනය
කොළඹ 15
ලි.ප. 5373
උදිරියක් ජයවීරගේ සිසිර රංජිත්
ස්වාධීන තටාක සේවක සංගමය සඳහා සහ වෙනුවට

සාක්ෂිකරුවන්

M. F. M. Najab
General Manager (Administration & Corporate Affairs)
Colombo Dockyard PLC
(Company No. PQ 50)
මොහොමඩ් ෆතිහු මොහොමඩ් නජාබ්
කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සඳහා සහ වෙනුවට

අකුරටියේ විතානගේ අනුර
ස්වාධීන තටාක සේවක සංගමය සඳහා සහ වෙනුවට

ඉහත සඳහන් අකිහිකෝ නකඋචි, මංගල ප්‍රේම බංඩා යාපා, අබේසිංහ ආරච්චිගේ ශ්‍යාමල් කුමාර ලක්ප්‍රිය අබේසිංහ, උදිරියක් ජයවීරගේ සිසිර රංජිත්, යන අයගේ අත්සන්වලට සාක්ෂිකරුවෝය.

.................................................

කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා)

Salary Scales for 2011 - 2013

| Work Category | Grade | Scale |
|---|---|---|
| | Special | 21,100/-420/-X 75 52,600 |
| | Higher | 19,600/-390/-X 75 48,850 |
| Industrial | I | 18,100/-360/-X 75 45,100 |
| | II | 17,100/-340/-X 75 42,600 |
| | III | 16,100/-320/-X 75 40,100 |
| | IV | 15,100/-300/-X 75 37,600 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| Supervisory | I | 23,200/-465/-X 75 58,075 |
| (Support) | II | 22,700/-455/-X 75 56,825 |
| | III | 22,200/-445/-X 75 55,575 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| Supervisory | I | 23,400/-470/-X 75 58,650 |
| (Secondary) | II | 22,900/-460/-X 75 57,400 |
| | III | 22,400/-450/-X 75 56,150 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| Supervisory | I | 23,900/-480/-X 75 59,900 |
| (Primary) | II | 23,400/-470/-X 75 58,650 |
| | III | 22,900/-460/-X 75 57,400 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| | Special | 26,400/-530/-X 75 66,150 |
| Forman | Higher | 25,900/-520/-X 75 64,900 |
| (Support) | I | 25,400/-510/-X 75 63,650 |
| | II | 25,000/-500/-X 75 62,500 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| | Special | 27,300/-545/-X 75 68,175 |
| Forman | Higher | 26,800/-535/-X 75 66,925 |
| (Secondary) | I | 26,300/-525/-X 75 65,675 |
| | II | 25,800/-515/-X 75 64,425 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| | Special | 28,300/-565/-X 75 70,675 |
| Forman | Higher | 27,800/-555/-X 75 69,425 |
| (Primary) | I | 27,300/-545/-X 75 68,175 |
| | II | 26,800/-535/-X 75 66,925 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| | Special | 27,300/-545/-X 75 68,175 |
| Technical | Higher | 26,800/-535/-X 75 66,925 |
| (Secondary) | I | 26,300/-525/-X 75 65,675 |
| | II | 25,800/-515/-X 75 64,425 |
| | III | 23,400/-470/-X 75 58,650 |
| | IV | 22,900/-460/-X 75 57,400 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| | Special | 28,300/-565/-X 75 70,675 |
| Technical | Higher | 27,800/-555/-X 75 69,425 |
| (Primary) | I | 27,300/-545/-X 75 68,175 |
| | II | 26,800/-535/-X 75 66,925 |
| | III | 23,900/-480/-X 75 59,900 |
| | IV | 23,400/-470/-X 75 58,650 |

| Work Category | Grade | Scale |
|---|---|---|
| | Supra | 26,400/-530/-X 75 66,150 |
| | Special | 23,350/-465/-X 75 58,225 |
| | Higher | 21,350/-425/-X 75 53,225 |
| Clerical | I | 18,350/-365/-X 75 45,725 |
| | II | 17,350/-345/-X 75 43,225 |
| | III | 16,350/-325/-X 75 40,725 |

ඇමුණුම 01

**පැහැදිලි කිරීම**

මෙම සාමූහික ගිවිසුමේ අංක 04 ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ එලෙසම බලපැවැත්විය යුතු යැයි සඳහන්ව ඇති පසුගිය සාමූහික ගිවිසුම්වල සඳහන් වගන්ති අතර,

01. 2008 - 2010 සාමූහික ගිවිසුමේ 05 (iv) වන වගන්තියෙහි අතිකාල ගණනය කිරීම යටතේ "සාප්පු හා කාර්යාල පනතින් ආවරණය නොවන සේවක මහතුන් සඳහා මූලික වැටුප 200න් බෙදා අතිකාල අනුපාතය ගණනය කරනු ඇත. එක් දිනක වැටුප තීරණය කිරීමේ දී මාසික වැටුප දින 26න් බෙදා ගණනය කෙරේ." යනුවෙන් සඳහන්ව ඇත.

02. 2008 - 2010 සාමූහික ගිවිසුමේ 05 (v) වන වගන්තියෙහි අතිකාල ගණනය කිරීම විධිමත් යටතේ "වැඩමුර ක්‍රමයට සේවයට වාර්තා කිරීමේ දී අවිධිමත් ලෙස සිදු කරනු ලබන අතිකාල ගෙවීම් හා අවිධිමත් ලෙස ලබාගන්නා විවේක දිනය අහෝසි කිරීමේ එකඟත්වය මත රාත්‍රී වැඩමුරයට වාර්තා කරන සේවක මහතුන් සඳහා වැඩමුර දීමනාවට අමතරව දිනකට රුපියල් 1,200/-ක මුදලක් ලබාදීමට කටයුතු කෙරේ. තව ද මෙම දීමනාවට ඉදිරියේ දී කිසිදු වෙනසක් නොකෙරේ. තවද පැය 16 තුළ දින දෙකක් ආවරණය කිරීම හේතුවෙන් පැමිණීමේ දීමනාව දින දෙකක් සඳහා ගෙවීම් සිදු කරනු ඇත. මේ සමග වැඩමුර ලේඛනයට අනුව සේවයට වාර්තා කළ යුතු අතර තමාට අයත් වැඩමුර දිනය වෙනස් කරගැනීමට ඉඩ ලබානොදේ." යනුවෙන් සඳහන්ව ඇත.

මංගල ද සිල්වා,
සාමාන්‍යාධිකාරි,
කොළඹ නැව් තටාකාංගනය.

ප්‍රධාන ලේකම්,
ස්වාධීන තටාක සේවක සංගමය,
කොළඹ නැව් තටාකාංගනය.

08 - 514